
# සිංදු යි බිංදු යි



මෙතුලි තස්නිකා කරුණාරත්න

# සිංදු යි බිංදු යි

මෙතුලි තස්නිකා කරුණාරත්න

# සිංදු යි බිංදු යි

## මෙතුලි තස්නිකා කරුණාරත්න

ලිපිනය : නො: 65/64,

හේවාහැට පාර,

තල්වත්ත,

මහනුවර.

කතෘගේ වෙනත් කෘති : සෙල්ලම් ගෙදර

දඟකාර අලි පැටියා

පුංචි කුරුලු පවුල

ISBN අංකය : 978-624-206-924-1

ප්‍රථම මුද්‍රණය : 2023-11-15

# ~ පිදුම ~

**මගේ ආදරණීය සමන්මලී ගුරුතුමියට**

**හා**

**මගේ පංතියේ සිටින සියළුම යෙහෙළියන්ට**

**ආදරයෙන් පුදමි.**

# ~ ස්තූතිය ~

මෙම පොත ලිවීමට

මට උදව් කළ හැම දෙනාටම

ස්තූතියි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම  යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමාගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසල් කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.



ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


2023.11.01


ඔන්න එකෝමත් එක රටක ලස්සන ගංගාවක් තිබුණා. මේ ගඟේ එක ඉවුරක් අසල පුංචි ම පුංචි මාළු පැටවු දෙන්නෙක් ජීවත් වුණා. එක්කෙනෙක් තමයි සිංදු අනිත් එක්කෙනා තමයි බිංදු මේ දෙන්නා හරි ම හොඳ යාළුවෝ.




ඒ වගේම සිංදු යි බිංදු යි හරි ම සතුටින් කාලය ගත කළා. ඒ වගේ ම සිංදු යි බිංදු යි හැමදාම හවසට සෙල්ලම් කරනවා.

ඔන්න දවසක් දා සිංදු යි බිංදු යි සෙල්ලම් කරන්නට ගඟ මැදට පීනා ගියා.


සිංදු :- බිංදු අද අපි මොකක් ද කරන සෙල්ලම සිංදු ඇසුවා.



අද අපි අල්ලන සෙල්ලම කරමු බිංදු කිව්වා හා එහෙනම් අපි අල්ලන සෙල්ලම් කරමු. සිංදුත් එකතුවුණා. හරි එහෙනම් මුලින්ම මම අල්ලන්නම් සිංදු කිව්වා. ඔන්න එහෙනම් 1, 2, 3 ඔන්න මම ඔයාව අල්ලන්නයි යන්නේ සිංදු කිවුවා.



ඔන්න ඔහොම ටික වෙලාවක් අල්ලන සෙල්ලම් කළා. දැන් අපි අල්ලන සෙල්ලම් කරන්නට පටන්ගෙන ගොඩක් වෙළා. මට තාම බිංදුව හොයාගන්න බැරි වුණා. අනේ බිංදුට කරදරයක් ද? දන්නේ නෑ.




ටික දුරක් ගිහින් බලන්න ඕනෑ. අනේ මටනම් දැන් ටිකක් බයයි වගේ සිංදුට හිතුණා. මේ වෙද්දි ගඟේ පාවෙලා ආ කොටයකට බිංදුගෙ ඇඟ හිරවෙලා එයා වේදනාවෙන් කෑ ගසිමිනුයි හිටියේ.



සිංදු ටික දුරක් යනකොට අනේ මාව බේරගන්න කියලා ශබ්දයක් ඇහුණා. අනේ ඒ බිංදුගේ කටහඬ නේද? මොන පැත්තෙන්ද ඒ සද්දේ ආවේ. මේ පැත්තෙන් වෙන්න ඇති ගිහින් බලමු අනේ බිංදු ඔයාව හිර වෙලා සිංදු අනේ මාව බේරගන්න.



අයියෝ අන්න මෝරෙක් එනවා දැන් අපි මොක ද කරන්නේ බිංදු මම අද ඔයාව බේරගන්නවා ඔයා බය නැතුව ඉන්නකෝ සිංදු කිව්වා. මම කොහොම ද දැන් බිංදු බේරගන්නේ මම මෙතන බිංදුව තනිකරලා නම් යන්නේ නෑ.



මම දැන් මොකක් ද කරන්නේ සිංදු කල්පනා කළා. මතක් වුණා යේ මට දැන් පුළුවන් බිංදුව බේරගන්න සිංදු ගිහින් ලණුවක් ගෙනාවා. ආ අන්න අතන රසවත් කෑමක් මෝරා හිතුවා. අනේ මාව කන්න එපා යාළුවේ අනේ සිංදු මාව බේරගන්න කියා බිංදු කෑගසනවා ඇසුණා.



සිංදු ඒ ලණුවෙන් මෝරාව ගැට ගැසුවා. මෝරාට කිසිවක් කර ගන්නට බැරි වුණා. සිංදු ඇවිත් බිංදුව බේරාගත්තා සිංදු ඔයාට ගොඩක් ස්තූතියි. බිංදු අපි ආය මේ පැත්තට එන්නෙ නැතුව ඉමු. ඉතින් සිංදු යි බිංදු යි හරි ම සතුටින් සෙල්ලම් කළා. හැබැයි අර නපුරු මෝරා ඉන්න පැත්තට නම් ගියේ නෑ.



සිංදු යි බිංදු යි සතුටින් ජීවත් වුණා. හොඳ යාළුවෝ එහෙ ම තමයි විපතට පත්වුණු යාළුවාව බේරගන්න උත්සාහ කරන්ට ඕන. අපිත් සිංදු යි බිංදු යි වගේ හොඳ යාළුවෝ වෙමු.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනාකරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය භික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතින් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01